# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2306/05 - 2022 නොවැම්බර් මස 14 වැනි සඳුදා - 2022.11.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ගොනු අංකය* : කඩු/ඉඩම්/01/142/WS.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4/3/9/2016/WS/533.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 479/ඊ බටපොත ග්‍රාම නිලධාරි වසමේ බටපොත ගමේ පිහිටි, සර්වේ ජනරාල් විසින් පිළියෙල කරන ලද කඩයිම් සිතියම් අංක 522028හි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0410ක් පමණ වූ විස්තර සඳහන් ඉඩම් කොටස.

කඩයිම් සිතියම් අංක 522028හි

**කැබලි අංකය 01**
ඉඩමේ නම: හිග්ගහවත්ත; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත; හිමිකම් පාන්නා: රජය.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම්/අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 නොවැම්බර් මස 17 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත් වන්දි මුදල් ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**කේ. චතුර මිහිඳුම්,**
ප්‍රාදේශීය ලේකම්,

2022 නොවැම්බර් මස 03 වැනි දින,
කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 11 - 0121

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ඉඩම් අමාත්‍යාංශ ගොනු අංකය*: 4-3/18/2019/ws/540.
*මගේ අංකය*: 3/6/2017/ජල.සම්./I-viii.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.


1A - G 38015 - 34 (2022/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 884 අමුණුගම ග්‍රාම නිලධාරි වසමේ පිහිටි, සර්වේ ජනරාල් විසින් මැන සකස් කරන ලද අ.ග.පි. 1492හි අතිරේක 13හි පත්‍ර අංක 11 හා 2022.10.25 දිනැති පිඹුරේ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ල.

**කැබලි අංක 290**

ඉඩමේ නම: මැල්වත්ත; මුල් හිමිකම් කියන්නන්: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්ටයාර් 0.2150.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම්/අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 දෙසැම්බර් මස 05 වැනි දින පෙ.ව. 10.00ට පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද 2022.11.20 වැනි දිනට මත්තෙන් එම ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත් වන්දි මුදල් හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**ඩී. අනෝමා දිසානායක,**
ප්‍රාදේශීය ලේකම්,
පොල්ගහවෙල.

2022 නොවැම්බර් මස 09 වැනි දින,
පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 11 - 0122

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය: ආර්බීකේ/එල්ඒඑන්/ඒකිවුයුආර්ර්/ඒ3/85V.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 4-3/6/2016/
එච්ඩබ්ලිව්/472.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2018.08.03 වැනි දින පළවූ අංක 2082/58 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ III වන කොටසෙහි සඳහන් කැබලි අංක 604 පහත සඳහන් පරිදි සංශෝධනය කරන බව මෙයින් දන්වා සිටිමි.

**1. කැබලි අංක 994**

ඉඩමේ නම: අම්බලන්මුල්ලතැන්න; විස්තරය: වත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: පී. පී. සෙනරත් වීරතිස්ස සහ ජී. ජී. නිමල් කීර්තිසිංහ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0227.

**2. කැබලි අංක 995**

ඉඩමේ නම: අම්බලන්මුල්ලතැන්න; විස්තරය: වත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඊ. ඩී. පී. චන්ද්‍රකාන්ති; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0017.

**ඩබ්. එල්. ආර්. ඉන්දික ලියනගේ,**
ප්‍රාදේශීය ලේකම්,
රඹුක්කන.

2022 ඔක්තෝබර් මස 29 වැනි දින,
රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 11 - 0123

---

ශුද්ධි පත්‍රිකාව

**දක්ෂිණ අධිවේගී මාර්ගය ඉදිකිරීම සඳහා**

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීම් සංශෝධනය

මගේ අංකය: ඩීඑස්ඒඑන්/එල්එන්ඩී/08/එල්ඒ/එච්ඩබ්/15.
ඉඩම් අමාත්‍යාංශයේ අංකය: 4-3/6/2019/එච්ඩබ්ලිව්/195.

ඉහත කරුණට අදාළව 2022 පෙබරවාරි මස 03 දිනැති 2265/42 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අති විශෙෂ *ගැසට් පත්‍රයේ* 7 වන වගන්තිය යටතේ අංක EOG 02-0377 යටතේ පළ කරන ලද දැන්වීම කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

ඒ අනුව එම දැන්වීමෙහි උපලේඛනය අ.ග.පි. 225 අතිරේක අංක 28 ට අයත් පත්‍ර අංක 35හි කැබලි අංක 1739 සිට 1741 (කැබලි 03) දක්වා පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0438ක් වූ ඉඩම් කොටස්.

01. **කැබලි අංක 1739 - ඉඩමේ නම: මයිලදෙනියමූකලාන හෙවත් ඉහලදිගනෙඅත්මගහේන; ඉඩමේ විස්තරය: මුඩුබිම; මුල් හිමිකම් පාන්නා: හේවා මයිනාත්තුගේ නිහාල්, හකුරුවෙල, තලම්පෝරුව; ප්‍රමාණය: හෙක්. 0.0073.**

මායිම්

*උතුර*: කැබලි අංක 1738 සහ 1447; *නැගෙනහිර*: කැබලි අංක 1450 සහ 1740; *දකුණ*: කැබලි අංක 1740 සහ 1741; *බටහිර*: කැබලි අංක 1469 සහ 1738.

02. **කැබලි අංක 1740 - ඉඩමේ නම: කෝන්ගහ කොරටුවහේන; ඉඩමේ විස්තරය: මාර්ගය සහ විවෘත මුඩුබිම; මුල් හිමිකම් පාන්නා: විජේසේකර පතිරණගේ අමරසේන, හකුරුවෙල, තලම්පෝරුව; ප්‍රමාණය: හෙක්. 0.0351.**

මායිම්

*උතුර*: කැබලි අංක 1739, 1447 සහ 1450; *නැගෙනහිර*: කැබලි අංක 1450 සහ 2ඒ; *දකුණ*: කැබලි අංක 2ඒ, 1742 සහ 1741; *බටහිර*: කැබලි අංක 1741 සහ 1739.

03. **කැබලි අංක 1741 - ඉඩමේ නම: ඉහලදිගනෙඅත්මග; ඉඩමේ විස්තරය: මාර්ගය සහ විවෘත මුඩුබිම; මුල් හිමිකම් පාන්නා: රජය; ප්‍රමාණය: හෙක්. 0.0014.**

මායිම්

*උතුර*: කැබලි අංක 1738, 1739 සහ 1740; *නැගෙනහිර*: කැබලි අංක 2ඒ සහ 1742; *දකුණ*: කැබලි අංක 1742 සහ 1467; *බටහිර*: කැබලි අංක 1467, 1470 සහ 1469.

ඒ අනුව නැවත හිමිකම් පරීක්ෂණය පැවැත්වෙන දිනය 2023 ජනවාරි මස 11 වැනි දින පෙ.ව. 10.00 ලෙසට සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දෙමි.

ප්‍රාදේශීය ලේකම් සහ අත්කර ගැනීමේ නිලධාරී,
අගුණකොළපැලැස්ස.

2022 සැප්තැම්බර් මස 20 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
අගුණකොළපැලැස්ස.

EOG 11 - 0125

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.